**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**
**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2026.05.04 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත්වීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1(III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

**විශේෂ සටහන :** මෙම තනතුර සඳහා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරින් වැඩ පැවරුම පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා සලකා බැලිය හැකිය.

## 02. තාක්ෂණික නිලධාරි (රසායනික) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** (i). අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුනක් (03) එක් වරකදී සමත් විය යුතුය.

**සහ**

(ii). (අ). වෛද්‍ය රසායානාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

(ආ). තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් හෝ රසායන විද්‍යාව / රසායනික ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලද N.V.Q. 5 වෙනි මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන :** ඉහත (ii) (ආ) හි සඳහන් සුදුසුකම්වල පිළිගැනීම අදාළ පීඨය විසින් නිශ්චය කරනු ලැබේ.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ලිඛිත සහ/ හෝ ප්‍රයෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1(III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

## 03. තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** (i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනක් (03) එකවර සමත් විය යුතුය.

**සහ**

(ii). තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ N.V.Q. 5 වෙනි මට්ටමට නොඅඩු නිපුනතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ලිඛිත හා/ හෝ ප්‍රයෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1 (III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

## 04. තාක්ෂණික නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** (i) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුනක් (03) එක් වරකදී සමත් විය යුතුය.

**සහ**

(ii). තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය හෝ ඊට සමාන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ N.V.Q. 5 වෙනි මට්ටමට නොඅඩු නිපුණතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ලිඛිත හා/ හෝ ප්‍රයෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1 (III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

## 05. සැලසුම් ශිල්පී (පහළ ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :** රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පිළිගත් ආයතනයකින් පවත්වන සැලසුම්කරු විභාගයකින් ලබාගත් සැලසුම්කරු පිළිබඳ සුදුසුකම් සපුරා තිබීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1 (III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

## 06. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත් වී තිබීම.

**සහ**

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)
(පැරණි විෂය නිර්දේශ යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ). පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

**සහ**

(ආ). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMN 1(III)
රු. 49,475 – 17 x 540 – 58,655/= (මාසික)

## 07. වෘත්තීය ශිල්ප ප්‍රදර්ශක (පැස්සුම්කරු) II ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** (i). පැස්සුම් වැඩ සහ කම්මල් වැඩ පිළිබඳව පළපුරුද්ද තිබිය යුතුය.

**සහ**

(ii). විශ්වවිද්‍යාලයක / රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**හෝ**

(iii). විශ්වවිද්‍යාලයක/ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක අවම වසර තුනක කාලයක් ඉහත අංක (i) යටතේ සඳහන් විෂය ක්ෂේත්‍රයේ විශේෂ ශ්‍රේණියේ පුහුණු ශිල්පියෙකු වශයෙන් සේවයේ යෙදී තිබීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMN 1(III)
රු. 49,475 – 17 x 540 – 58,655/= (මාසික)

## 08. පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරු III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටිය යුතුය.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UPL 1 (III)
රු.42,775 – 16 x 450 – 49,975/= (මාසික)

## 09. විදුලි කාර්මික III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ වෘත්තීය පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UPL 3 (III)
රු. 48,005 – 16 x 490 – 55,845/= මාසික

**සටහන** : සෑම අයදුම්කරුවෙකුම;

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය ඉටු කිරීමට සහ තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරිමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

ඉහත මූලික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද අනෙකුත් දීමනා ද අදාළ රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

| | | |
|---|---|---|
| i. ජීවන වියදම් දීමනාව | - | රු.17,800.00 |
| ii. MCA දීමනාව | - | මූලික වැටුපෙන් 36% - රු.330/= |

**සේවා කොන්දේසි**

1. මෙය ස්ථිර තනතුරකි. පත්වීම් වසර තුනක (03) ක පරිවාස කාලයක් සඳහා යටත්වය.
2. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරයි නම් ඔහුගේ / ඇයගේ අදාළ පත්වීම් අධිකාරිය හරහා තම නිදහස් කිරීම ලබා ගත යුතුය.
3. විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී රජයේ සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට අයිතියක් නොමැත.

**ප්‍රතිලාභ**

1. තෝරාගත් අපේක්ෂකයින් තම ඉපයීම් වලින් සියයට දහයකට (10%) සමාන මුදලක් මාසිකව අඩු කිරීමෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර ඊට අමතරව විශ්වවිද්‍යාලය තම අරමුදල්වලින් තම ඉපයීම්වලින් සියයට හතකට (07%) සමාන මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ තම ඉපයීම්වලින් සියයට අටකට (08%) සමාන මුදලක් විශ්‍රාම වැටුප් අරමුදලට දායක කරනු ඇත.
2. සේවක භාර අරමුදල ප්‍රතිපාදන අනුව විශ්වවිද්‍යාලය විසින් ඔහුගේ / ඇයගේ මූලික වැටුපෙන් සියයට තුනක් (03%) සේවක භාර අරමුදලට දායක කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

www.sab.ac.lk /Vacancies යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් "අයදුම්පත්" බාගත කර ගත හැකිය.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලද නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, උපාධි සහතික, වෘත්තීය සහතික ආදියෙහි සහතික කළ පිටපත් සමඟ **2026.05.04** දිනට හෝ ඊට පෙර **සහකාර ලේඛකාධිකාරි / අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඕනෑම ලිපි හුවමාරුවක් හෝ විමසීමක් සඳහා 045-2280047 අංකය හරහා අප හා සම්බන්ධ විය හැකිය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2026.04.10